# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## විෂය නිර්දේශය

## 6 වන ශ්‍රේණිය

**(2018 සිට ක්‍රියාත්මක වේ)**

**තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව**

**විද්‍යා හා තාක්ෂණ පීඨය**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

**ශ්‍රී ලංකාව**

**www.nie.lk**

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**

**6 ශ්‍රේණිය - විෂය නිර්දේශය**

© **ජාතික අධ්‍යාපන ආයතනය**

**ප්‍රථම මුද්‍රණය 2018**

ISBN:

**තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව**
**විද්‍යා හා තාක්ෂණ පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

**වෙබ් අඩවිය :** www.nie.lk

**විද්‍යුත් තැපැල :** info@nie.lk

මුද්‍රණය :

| **පටුන** | | **පිටුව** |
| --- | --- | --- |
| 1.0 | හැඳින්වීම | ii |
| 2.0 | පොදු ජාතික අරමුණු | iii |
| 3.0 | මූලික නිපුණතා | iv - v |
| 4.0 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය නිර්දේශයේ අරමුණු | vi |
| 5.0 | ජාතික ඉලක්ක මෙම විෂය නිර්දේශයේ දී යොදා ගන්නේ කෙසේ ද | vii |
| 6.0 | විෂය නිර්දේශය | 1-3 |

## හැඳින්වීම

වැඩ ලෝකයෙහි ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දායකත්වය ඉතා ඉහළ බව නූතන ලෝකයේ පිළිගැනීම යි. කෙසේ වෙතත් අද බහුතරයක් ශ්‍රී ලාංකික සිසුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා නූතන ව්‍යාපාරික ලෝකයට යෝග්‍ය වන මට්ටමක නොපවතියි. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ පාසල් විෂය මාලාවෙහි ලා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හැදෑරීමට ඉඩ ප්‍රස්තා මඳ වීම ය. ප්‍රධාන වශයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ව්‍යාවසායික කුසලතා වර්ධනය කළ යුතු ය. සිසුන් වෙනස් වන ලෝකයේ විවිධ ජීවන අවශ්‍යතාවලට ගැළපෙන විවිධ කුසලතා පාසලේ දී උගත යුතු ය. අඛණ්ඩ ව අධ්‍යාපන කටයුතුවල යෙදීමටත්, රැකියාවලට යොමු වීමටත් සිසුන් සතු ව දැක්මක් සහ ක්‍රමවේදයක් තිබිය යුතු ය.

වර්තමානයේදී ශ්‍රී ලංකාව තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස සීමිත පාසල් කිහිපයක අ.පො.ස (සා/පෙළ) සඳහා උගන්වන අතර ඊටත් වඩා අඩු පාසල් සංඛ්‍යාවක අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) පන්තිවලට උගන්වනු ලැබේ. මෙම තත්ත්වය නිසා සිසුන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඉගෙන ගැනීම ආරම්භ කරන්නේ 10 ශ්‍රේණියේ දී ය. අ.පො.ස. (සා/පෙළ) තොරතුරු තාක්ෂණ විෂයයට, අධික බරක් සහිත විෂය කරුණු ඇතුළත් වන බැවින් එම බර අඩු කිරීමට අනිවාර්යයෙන් ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය කරුණු බෙදාහැරීමට, පහළ ශ්‍රේණිවල දී මෙම විෂයය ඉගෙන ගත යුතුය. ඒ නිසා 6 ශ්‍රේණියේ සිට විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

6 ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය සඳහා වසරකට කාලච්ඡේද 30 ක් (මිනිත්තු 40 බැගින්) පමණක් වෙන් කර ඇත. මෙම කාලය තුළ න්‍යායික අන්තර්ගතය සීමිත ප්‍රමාණයක් සමඟ ප්‍රායෝගික අංශය වැඩි වශයෙන් ඉගෙනීමට සිදු වේ. මෙය 6 ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයෙහි දෘඪාංග හා මෘදුකාංග සමඟ අන්තර් ක්‍රියාකාරිත්වය මඟින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංකල්ප ගොඩනඟා ගැන්ම සිසු අපේක්ෂාව යි. මනා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණුවක් සමඟ දෘශ්‍ය පරිසරය තුළ යතුරු පුවරුව සහ මූසිකය හසුරුවාලීම සඳහා, අන්තර්ජාලයේ මූලික භාවිතය සහ මූලික ක්‍රමලේඛන නිපුණතා මෙම විෂය නිර්දේශයේ සාකච්ඡා කර ඇත

## 2. පොදු ජාතික අරමුණු

1 මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම හා සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකික අනන්‍යතාවය තහවුරු කිරීම.

2 වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

3 මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

4 පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

5 සුසමාහිත වූ සමබර පෞරුශයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලි චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

6 පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායකවන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

7 සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

8 ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායකවන යුක්තිය, සමානාත්වය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව (2003)

# 3. මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත

**(i.) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

**රූපක භාවිතය :** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණතා :** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළදී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම.

**(ii.) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම. විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා. නව සොයා ගැනීම් සහ ගවේශණය වැනි වර්ගීය කුසලතා, ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්. චිත්තවේගී.

**(iii.) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණ සාමාජික ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

**ජෛව පරිසරය :** සජීව ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

**භෞතික පරිසරය** :

අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවයේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය. විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව, ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**(iv.) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම, හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාල සේවා නියුක්ති හා සම්බන්ධ කුසලතා.

**(V.) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**(vi.) ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**(vii.) "ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**

සීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙක මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියන් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේදී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

## 4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය නිර්දේශයේ අරමුණු

පෙර නොවූ විරූ තරම් දැවැන්ත වර්ධනයක්, සංවර්ධනයක් සහ භාවිතයක් තොරතුරු සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ අද දක්නට ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සියලු වයස් කාණ්ඩවල පුද්ගලයන්ට අදාළ වේ. එමෙන්ම වැදගත් වේ. එබැවින් මෙම ක්ෂේත්‍රයට අදාළ න්‍යායාත්මක සහ ප්‍රායෝගික නිපුණතා ලබා දීම අධ්‍යාපනයේ මුල් අවදියේ සිට ම ආරම්භ කළ යුතු ය.

පාඨමාලාව මඟින් ළඟා කරගන්නා අරමුණු පහත දැක්වේ

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත්වලට ප්‍රවේශ වීමට ප්‍රයෝජනවත් වන මූලික හැකියාවන් සංවර්ධනය කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත් භාවිතය සඳහා වන මූලික හොඳ පුරුදු හුරු වීම.
- මූලික පරිගණක සාක්ෂරතාවක් ඇති කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය අඛණ්ඩ ව හැදෑරීමට අවශ්‍ය පදනම ලබාදීම

## 5. ජාතික ඉලක්ක මෙම නිර්දේශයේ දී යොදා ගන්නේ කෙසේ ද?

| ජාතික ඉලක්ක | නිර්දේශයේ අරමුණු | විෂය නිර්දේශයේ අභිමතාර්ථ (නිපුණතා) |
| --- | --- | --- |
| සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණාත්මක කුසලතා, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වග වීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම. | • ක්‍රමලේඛ ආශ්‍රිත මූලික සංකල්ප සංවර්ධනය කිරීම | • පරිගණකවල වැදගත් බව අගයයි. |
| පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම | • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත් වලට ප්‍රවේශ වීමට ප්‍රයෝජනවත් වන මූලික කුසලතා සංවර්ධනය කිරීම.<br>• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත් භාවිතය සඳහා වන මූලික මනා පුරුදු හුරු වීම | • ආරක්ෂිත ව සහ මනා ලෙස පරිගණක භාවිත කිරීම අගයයි. |
| සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයෙහි සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම. | • මූලික පරිගණක සාක්ෂරතාවක් ඇති කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය දීර්ඝ වශයෙන් හැදෑරීම සඳහා අවශ්‍ය පදනම ලබාදීම | • මෙහෙයුම් පද්ධති භාවිත කරයි<br>• යෙදවුම් මෘදුකාංග උචිත ව භාවිත කරයි<br>• සරල ක්‍රමලේඛ සංවර්ධනය කරයි<br>• අන්තර්ජාලය භාවිත කරයි |

| 6- ශ්‍රේණිය විෂය නිර්දේශය<br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලය/ කාලච්ඡේද ගණන Periods |
| 1. පරිගණකවල වැදගත්කම අගයයි | 1.1 පරිගණකවල කාර්යයන් සහ ලාක්ෂණික ගුණ පැහැදිලි කරයි | • පරිගණකයෙහි නිර්වචනය , ආදාන, සැකසුම, ප්‍රතිදාන, ආචයනය<br>• මිනිසාට එරෙහි ව පරිගණකය<br>○ වේගය සහ කාර්යක්ෂමතාව<br>○ නිරවද්‍යතාව<br>○ විශ්වසනීයතාව<br>○ නියත බව<br>○ ආචයන ධාරිතාව<br>○ පිරිවැය<br>○ බුද්ධිමය බව<br>• නිහිත පරිගණක සහිත උපාංග<br>○ ජංගම දුරකථන<br>○ නූතන රූපවාහිනී යන්ත්‍ර<br>○ රෙදි සෝදන යන්ත්‍ර<br>○ මෝටර් රථ | i. පරිගණකයෙහි සංරචක (components) හඳුනා ගනියි<br>ii. පරිගණකයෙහි භූමිකාව විවිධ පැතිකඩවලින් විස්තර කරයි<br>iii. පරිගණකයෙහි ක්‍රියාව සහ ලාක්ෂණික ගුණ ලැයිස්තු ගත කරයි<br>iv. උපාංග (උපක්‍රම) ආශ්‍රිත නිහිත පරිගණක හඳුනා ගනියි | 1 |
| | 1.2 පරිගණක සංරචක හඳුනා ගනියි | • මධ්‍ය සැකසුම් ඒකකය<br>• මතකය<br>• ආදාන/ප්‍රතිදාන උපක්‍රම<br>• ආචයන උපක්‍රම<br>• සන්නිවේදන උපක්‍රම | i. පරිගණකයෙහි මධ්‍ය සැකසුම් ඒකකය හඳුනා ගනියි<br>ii. විවිධ ආදාන උපාංග (උපක්‍රම) ලැයිස්තු ගත කරයි<br>iii. විවිධ ප්‍රතිදාන උපාංග(උපක්‍රම) ලැයිස්තු ගත කරයි<br>iv. විවිධ ආචයන උපාංග (උපක්‍රම) ලැයිස්තු ගත කරයි<br>v. විවිධ සන්නිවේදන උපාංග (උපක්‍රම) ලැයිස්තු ගත කරයි | 2 |

| | | | | |
|---|---|---|---|---|
| | 1.3 මෘදුකාංගවල අවශ්‍යතාව විස්තර කරයි | • මෘදුකාංග අවශ්‍යතා<br>• මෘදුකාංග - සඳහා උදාහරණ<br>○ පරිගණක ක්‍රීඩා<br>○ මාධ්‍ය ධාවකය<br>○ චිත්‍රක මෘදුකාංග | i. මෘදුකාංගවල අවශ්‍යතාව පැහැදිලි කරයි<br>ii. විවිධ මෘදුකාංග ලැයිස්තු ගත කරයි | 1 |
| | 1.4 දෑටින ක්‍රියාවන් විසඳීම සඳහා පරිගණකයේ භාවිතය අගය කරයි | • පාසලෙහි සහ වෙනත් ප්‍රදේශයන්ගේ ඇති යෙදවුම් භාවිත වන ප්‍රදේශ හඳුනා ගැනීම (අධ්‍යාපන මෘදුකාංග, පුස්තකාල කළමනාකරණ පද්ධති, ... ආදිය)<br>• පරිගණකයෙහි භූමිකාව<br>○ පාසල තුළ<br>○ බැංකු තුළ<br>○ රෝහල් තුළ<br>○ කර්මාන්ත ශාලා තුළ<br>○ ගොවිපොළවල් තුළ | i. අධ්‍යාපන සහ වෙනත් ප්‍රදේශයන්ගේ යෙදවුම් විභවය විස්තර කරයි. | 1 |
| 2. පරිගණක ආරක්ෂිත ව භාවිත කිරීමේ අවශ්‍යතාව අගය කරයි | 2.1 පරිගණක විද්‍යාගාර නිවැරදි ව පරිහරණය කරයි | • අනුගමනය කළ යුතු යහපත් පුරුදු<br>○ විද්‍යාගාරය දුහුවිල්ලෙන් තොර ව තබා ගැනීම<br>○ විද්‍යාගාරය තුළ ආහාර පානාදිය ගැනීමෙන් වැළකීම<br>○ විද්‍යාගාරයේ දී පරිහරණය කරනු ලබන දෑ නියමාකාරයෙන් තැබීම | i. පරිගණක විද්‍යාගාරයේ දී අනුගමනය කළ යුතු යහපත් පුරුදු තෝරුම් ගනී<br>ii. පරිගණක විද්‍යාගාරයේ දී හොඳ පුරුදු අනුගමනය කරයි | 1 |
| | 2.2 පරිගණක සහ පර්යන්ත සුපරීක්ෂාකාරී ව භාවිත කරයි | • පරිගණකයේ ආරම්භයට /නිමාවට අදාළ නිවැරදි පියවර<br>• පරිගණකය භාවිතයේ ආචාර ධර්ම<br>• නිවැරදි ඉරියව්<br>• පරිගණක දෘඪාංග ආරක්ෂාකාරී ව බැහැර කිරීම සහ විනාශ කිරීම<br>• මුරපද භාවිත කිරීම | i. පරිගණකයේ ඇරඹුම /නිමාව සඳහා නිවැරදි පියවර අනුගමනය කරයි<br>ii. ආචාර ධර්මවලට අනුකූල ව පරිගණක භාවිත කරයි<br>iii. කල් ඉකුත් ව ඇති පරිගණක/පර්යන්ත උපාංග ආරක්ෂිත ව ඉවත් කරයි<br>iv. 'ආරක්ෂිත පරිගණක පරිහරණය' අවබෝධ කරගෙන භාවිත කරයි | 1 |

| | | | | |
|---|---|---|---|---|
| 3. මෙහෙයුම් පද්ධති භාවිත කරයි | 3.1 ගොනු හසුරුවයි | • සරල චිත්‍රක මෘදුකාංග උපයෝගී කර ගනිමින් ගොනු හැසිරවීම් කරයි. ඒ මගින්<br>○ නිර්මාණය<br>○ සුරැකීම<br>○ විවෘත කිරීම<br>○ සංස්කරණය<br>○ වසා දැමීම<br>• කවුළුවක් උපරිම කිරීම / අවම කිරීම / ප්‍රතිප්‍රමාණ කිරීම | i. ගොනුවක් නිමවා සුරකියි<br>ii. ගොනුවක් විවෘත කර සංස්කරණය කරයි<br>iii. කවුළුවක් උපරිම කිරීම / අවම කිරීම / ප්‍රතිප්‍රමාණ කිරීම සඳහා පුරුදු වේ | 2 |
| 4. යෙදුම් මෘදුකාංග උචිත ලෙස භාවිත කරයි | 4.1 පාඨ සංස්කරණයන් සහ චිත්‍රණ මෘදුකාංග ඵලදායී ව භාවිත කරයි | • මූසිකය නිසිලෙස හැසිරවීම සඳහා චිත්‍රණ මෘදුකාංග උපයෝගී කර ගැනීම<br>• යතුරු පුවරු හැසිරවීමේ කුසලතාව ප්‍රවර්ධනය කිරීම සඳහා යතුරු ලියන මෘදුකාංග උපයෝගී කර ගැනීම | i. මූසිකය සහ යතුරුපුවරුව ඵලදායී ව භාවිත කරයි<br>ii. නිවැරදි ඇඟිලි චලන භාවිත කරමින් යතුරු ලියනය කරයි<br>iii. මූසිකය උපයෝගී කරගෙන චිත්‍ර අඳියි | 5 |
| | 4.2 ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සංස්කරණ මෘදුකාංග ඵලදායී ව භාවිත කරයි | • ශ්‍රව්‍ය පසුරක්(Audio clip) නිර්මාණය කිරීමට ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග භාවිත කිරීම<br>• දෘශ්‍ය පසුරක් නිර්මාණය කිරීමට දෘශ්‍ය සංස්කරණ මෘදුකාංග භාවිත කිරීම | i. ශ්‍රව්‍ය ගොනුවක් නිර්මාණය කරයි<br>ii. දෘශ්‍ය ගොනුවක් නිර්මාණය කරයි | 2 |
| 5. ඇල්ගොරිතම සංකල්පය අගය කර සරල ක්‍රමලේඛ සංවර්ධනය කරයි | 5.1 ඇල්ගොරිතමයකට අදාළ ව වන ප්‍රායෝගික ගැටලු විසඳීමේ ක්‍රියාවලිය විස්තර කරයි | • වට්ටෝරුවකට අනුව අන්තර්ගතයන් සැකසීම<br>(උදා- කේක් එකක් සෑදීම) | i. පියවර අනුක්‍රමයක් ලෙස ගැටලු විසඳීමේ ක්‍රමවේදය හඳුනා ගනියි | 2 |
| | 5.2 ක්‍රියාවලියක් පැහැදිලි කිරීම සඳහා ගැලීම් සටහන් අඳියි | • ගැලීම් සටහන් සංකේත හැඳින්වීම<br>○ ආරම්භය/නිමාව<br>○ ආදාන/ප්‍රතිදාන<br>○ ක්‍රියාවලිය<br>• ගැලීම් සටහන් යොදා ගනිමින් එදිනෙදා කාර්යයන්ගේ ක්‍රියාවලීන් නිරූපණය කිරීම | i. ගැලීම් සටහන් සංකේත හඳුනා ගනියි<br>ii. ගැලීම් සටහනකින් ක්‍රියාවලිය ඉදිරිපත් කරයි | 3 |

| | | | | |
|---|---|---|---|---|
| 6. තොරතුරු රැස් කිරීම හා සන්නිවේදනය සඳහා අන්තර්ජාලය භාවිත කරයි | 6.1 තොරතුරු මූලාශ්‍රය බෙදාගත හැකි සංචිතයක් ලෙස අන්තර්ජාලය හඳුනා ගනී | • අන්තර්ජාලය හැඳින්වීම<br>• අතරික්සු කිරීම් පුහුණුව සඳහා අධ්‍යාපන වෙබ් අඩවි කරා ප්‍රවේශ වීම | i. අන්තර්ජාලය අර්ථ දක්වයි<br>ii. අන්තර්ජාලයට ප්‍රවේශ වෙයි<br>iii. අධ්‍යාපන වෙබ් අඩවි හරහා තොරතුරු ලබා ගනියි | 3 |
| | 6.2 තොරතුරු ලබා ගැන්ම සඳහා සෙවුම් යන්ත්‍ර භාවිත කරයි | • සෙවුම් යන්ත්‍ර හැඳින්වීම<br>• විශේෂ මාතෘකා ඔස්සේ තොරතුරු සෙවීම සඳහා සෙවුම් යන්ත්‍ර උපයෝගී කරගැනීම | i. සෙවුම් යන්ත්‍ර පරිශීලනය කර තොරතුරු ලබා ගනියි | 5 |
| | 6.3 පරිගණක සහ දත්ත ආරක්ෂිත ව සහ සුරක්ෂිත ව භාවිත කරයි | • ප්‍රවේශයන් පාලනය කිරීමේ යාන්ත්‍රණික යෙදවුම් (පරිශීලක නාමය, මුරපද… ආදිය) | i. සුරක්ෂිත සහ ආරක්ෂිත ක්‍රියාපරිපාටි අනුගමනය කරයි<br>ii. විශ්වාසවන්ත උපදේශකත්ව මඟපෙන්වීමේ ඇති වැදගත්කම අවබෝධ කර ගනියි | 1 |
| එකතුව | | | | 30 |